# සිනුවර හසුන



*සිඩ්නි සිට ලියමි*

සිංහල භාෂාව සහ සංස්කෘතිය, පොදුවේ මේ දකුණු කුරු දිවයින තුල ද, සුවිශේෂීව සිනුවර අග නගරය කරගත් නිව් සවුත් වේල්ස ප්‍රාන්තය තුල ද ප්‍රවර්ධනය කිරීම සඳහා ඇප කැප වී ක්‍රියාකරන, සිනුවර ප්‍රමුඛ ප්‍රජා සංවිධානයක් වන සිංහල සංස්කෘතික හමුව මේ සමරන්නේ සිය විසිවන ක්‍රියාකාරී වර්ෂයයි.
මේ සංවත්සරය මොනවට සනිටුහන් කරමින් 2010 ඔක්තෝම්බර් මස තුන්වෙනි ඉරිදා පැවැත්වුනු මනරම් උත්සවයක දී, ඕස්ට්‍රේලියාව, එහි පරිසරය, ඉතිහාසය, ප්‍රජාව සහ සංස්කෘතිය පිළිබඳව සම්ප්‍රදායානුකූල සිංහල සඳැස් පැදි බසින් රචිත දකුණු කුරු දිවි කවි - Australia: Sinhala Poetic Impressions නම් වූ ග්‍රන්ථයක් එළි දක්වන්නට යෙදුණි.




*දකුණු කුරු දිවි කවි - Australia: Sinhala Poetic Impressions ග්‍රන්ථයේ පළමු පිටපත එහි සංස්කාරකවරුන් වන රසික සූරියආරච්චි සහ හෙන්රි කුමාරප්පෙරුම මහත්වරුන් විසින් සිංහල සංස්කෘතික හමුවේ සභාපති සමන් මහානාම දිසානායක මහතා ට පිළිගන්වනු ලැබූ අවස්ථාව*

සිංහල සංස්කෘතික හමුවේ ප්‍රකාශණයක් වන මෙම කෘතිය සඳහා මේ දකුණු කුරු දිවයිනේ දසත වෙසෙන කවි කිවිඳියන් තිස් තුන් දෙනෙක් නිර්මාණදායකත්වය සපයා තිබීම විශේෂයකි. මෙම ග්‍රන්ථය රසික සූරියආරච්චි සහ හෙන්රි කුමාරප්පෙ-රුම ගේ සම සංස්කාරකත්වයෙන් සැකසී, කොළඹ දයාවංශ ජයකොඩි සමාගම මගින් මුද්‍රණය කරවා බෙදහරිනු ලැබේ.




මෙම කෘතියේ පිටපතක් ඔබට මිළදී ගැනීමට අවශ්‍ය නම් සිංහල සංස්කෘතික හමුවේ සභාපති සමන් මහානාම දිසානායක (02-98371480) අමතන්න.

දකුණු කුරු දිවි කවි - Australia: Sinhala Poetic Impressions ග්‍රන්ථයේ එන දීපිකා සුන්ද්‍රා වඩුගේ රචනා කළ සුනිල කඳු වැටිය නම් වූ කවි පෙළ ඔබේ රස වින්දනය පිණිස මෙහි බහාලමි.

මිහිදුම් වලා පට සළු පිලි ගතේ ද රා
සුනිල ගුවන වෙත යොමු කර බැළුම් නුරා
සැතපෙන ළඳුන් මෙන් මනහර දසුන් අ රා
නිල් කඳු වැටිය සැම දෙනුවන් වශී ක රා

රොන් සුනු උරන බිඟු සේනා හඬට ස ම
දසතින් හමන මඳනළ සිප වැළඳ පෙ ම
නෙක තුරු රැසින් එන සිසිලස අසම ස ම
නිල් කඳු වැටිය මිහිබට සුර පුරකි අ ම

සියොත් සරති දසතින් ගෙන මියුරු න ද
තුරු මත එතෙති ලිය වැල් සම නුරා ළ ද
-කැන්ගරු, වොලබි", සිව්පා සත කොතෙක් ව ද
නිල් කඳු වැටිය නිති ඒ සැම රකියි සො ඳ

ගිරිකුළු පවුරු එකිනෙක පරයා නැගෙ නා
ගෙන එන දසුන සිහි කරවයි ගජ සේ නා
එමතින් හමන මාරුතයෙහි මුදු නදි නා
සුරඟන වයන මුදු වෙණ සර සිහි කෙරෙ නා

ශීත ඉමේ පෙරෙනා සඳ කැන් රැසි රූ
ඝන මීදුමෙහි දැවටී දිලෙනා අයු රූ
දෙව් අඟනෝ නුබ කුස සරනා රැසි රූ
නිල් කඳු මතට බසිනට ලොබ වෙති මිතු රූ

මායා බලෙන් සිර කර ගල් කුළු ලෙසි නා
සොයුරු පෙමින් බැඳි තිදෙනෙකු වෙති ලල නා
ජනවහරෙහි පැවතෙන මෙපුවත සොඳි නා
නිල් කඳු යාය මනරම් කර ඇත සොබ නා

සහසක් නෙතැති ඉඳුවර දෙන රැස් දහ රා
පියඹන සුදු වලා නිලඹර පිණි තව රා
ජීවය තනා තුරුලිය ගොමු තුළ අතු රා
නිල් කඳු පියස සැඟවෙත එම ජල දහ රා

කඳු වැටි නිම්න මිටියාවත් හෙල් නී ලේ
නෙක වන් කුසුම් මල් බරවී පා ලී ලේ
තුරුලිය මතින් එන නල මුසු වී සී ලේ
නිල් කඳු වෙතින් නික්මීමට සිත නෑ ලේ

ලබන මාසයේ නැවත හමුවෙමු.

සිනුවර ආරච්චිල
<sinuwara.arachchila@gmail.com>




**Mathematics/ Science.**

Year 7 -10
$20 per hour.
**Current Uni Student in Maths and Science.**
Tel: 0433 737 584
or 9701 3241